# මහනුවර සම්ප්‍රදායේ පිරිත් මණ්ඩප දෙකක් පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනයක්

එස් කුරුණායක

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.

shali.kurunayaka@gmail.com

ප්‍රමුඛ පදඃ පිරිත් මණ්ඩප, මහනුවර යුගයේ සිතුවම්, කැටයම් කලාව, පහතරට සිතුවම්, සැරසිලි කලාව

## හැඳින්වීම

බුදුරජාණන් වහන්සේ ජීවමානව වැඩසිටි සමයේදී පිරිත් පිංකම් පැවති බවට ධම්මපදට්ඨ කතාවේ දීඝායු කුමාර වස්තුවෙහි සඳහන් කර ඇත. (ප්‍රියරත්නඃ 2002. 38) එහිදී අලංකාර මණ්ඩප ද්වාරයෙහි භික්ෂූන් වහන්සේලා 16 නමක් වැඩහිඳි බව සඳහන් ය. එමෙන් ම ලංකාවේ ද අනුරාධපුර සමයේ සිට ම පිරිත් දේශනා සඳහා පිරිත් මණ්ඩපය යොදාගත් බවට විවිධ සාධක හමුවේ. මෙහිදී බොහෝ විට භාවිතාකර තිබෙන්නේ ස්වාභාවික ද්‍රව්‍ය යොදාගෙන අලංකාරවත් පිරිත් මණ්ඩප සාදා ගැනීමයි. පොළොන්නරු අවධියේදී ඉදි වූ ශෛලමය පිරිත් මණ්ඩපයක් ලෙස නිශ්ශංකලතා මණ්ඩපය පෙන්වාදිය හැකිය. එහෙත් මහනුවර අවධිය වන විට ඉතා අලංකාර සැරසිලි මෝස්තර සහිතව ස්ථිර පිරිත් මණ්ඩප දැවයෙන් ඉදි කිරීම සිදු කරන ලදී. ශ්‍රී ලංකාවේ දකුණු වෙරළබඩ තීරයට අයත් විහාරස්ථාන කිහිපයක මෙවැනි පිරිත් මණ්ඩප දැකගැනීමට හැකියාව ලැබේ.

මෙම අධ්‍යයනය සඳහා අහංගම බිම්බාරාම විහාරස්ථානයේ පිරිත් මණ්ඩපයත්, කරගම්පිටිය ශ්‍රී සුබෝධාරාම රජමහා විහාරස්ථානයේ පිරිත් මණ්ඩපයත් යොදා ගැනීම සිදු කරනු ලබයි. අහංගම බිම්බාරාම විහාරස්ථානය 19 වන සියවසේදී නිමවන ලද පහතරට සිත්තර ශෛලියට අයත් සිතුවම් සහිත විහාරස්ථානයකි. මෙම විහාරස්ථානයේ ප්‍රධාන ගොඩනැගිලි තුනක් වන අතර ගොඩනැගිලි දෙකක් අෂ්ටාකාර හැඩයකින් යුක්ත ය. විහාර ගෙය සහිත කුටිය චතුරස්‍රාකාර හැඩයක් ගනියි. විහාරස්ථානයේ ප්‍රධාන දොරටුවේ සිට පිවිසෙන විට හමුවන දෙවන අෂ්ටාකාර ගොඩනැගිල්ලෙහි මධ්‍යයෙහි පිරිත් මණ්ඩපය වේ. එම පිරිත් මණ්ඩපය ගොඩනැගිල්ලෙහි වන අෂ්ටාකාර ආකෘතියට ම සකස්කර ඇත. මෙහි මධ්‍යයේ එක් ධර්මාසනයකි. මණ්ඩපයේ පිටතින් ලී කැටයමින් අලංකාර කර තිබෙන අතර පිටතින් වූ කැටයම් රටාව මණ්ඩපයේ ඇතුළතින් සිතුවම් කර ඇත. මෙහි මහනුවර සම්ප්‍රදායට අයත් සාම්ප්‍රදායික සැරසිලි මෝස්තර රටා රාශියකි.

මෙම පර්යේෂණය තුළින් අධ්‍යයනය කරනු ලබන අනෙක් පිරිත් මණ්ඩපය කරගම්පිටිය සුබෝධාරාමයේ වන අතර එය 1820 වර්ෂයේ පිහිටු වන ලද බව සඳහන් වේ. එහි ඇතුල් ගැබ බිත්ති වල එන පැරණි සිතුවම් 19 වන සියවසේ අග භාගයට අයත් බව නිර්මාණ ලක්ෂණ අනුව කිව හැකි ය. මෙම විහාරස්ථානයේ සතරැස් ආකෘතියකින් යුත් ගොඩනැගිල්ලක සතරැස් හැඩැති පිරිත් මණ්ඩපය වේ. මෙහි ලියකම්, මල්කම්

රටාවලින් යුත් කැටයම් මෝස්තර මෙන් ම පහතරට ශෛලියට අයත් සිතුවම් ද දැක ගැනීමට හැකියාව ලැබේ.

මෙම විහාරස්ථාන දෙකෙහි ම පවතින පිරිත් මණ්ඩප 19 වන සියවසට අයත් වුවත් එහි වන කලාත්මක ලක්ෂණ වෙනස් මුහුණුවරකින් යුක්ත ය. මේ ඔස්සේ සංසන්දනාත්මක අධ්‍යයනයක් කිරීම මෙම පර්යේෂණයෙන් අපේක්ෂිතය. මෙම පර්යේෂණයේ අරමුණ ලෙස

- 19 වන සියවසේ නිර්මාණය වූ පිරිත් මණ්ඩප සඳහා බලපෑ කලාත්මක පසුබිම පිළිබඳව සංසන්දනාත්මක අධ්‍යයනය.
- දේශීය කැටයම් කලාව කෙරෙහි යුරෝපීය බලපෑම.
- පහතරට සිතුවම් කලාව සඳහා බලපෑ යුරෝපීය බලපෑම සහ එමඟින් හෙළිවන සමාජ පසුබිම.
- යොදාගත් වාස්තු විද්‍යාත්මක ක්‍රමවේද සහ අමුද්‍රව්‍ය පිළිබඳව අධ්‍යයනය.
- වර්තමාන තත්ත්වය හා උපයෝගිතාව පිළිබඳව හඳුනාගැනීම.

ආදිය දැක්විය හැකි ය.

**ක්‍රමවේදය**

මෙම අධ්‍යයනය සඳහා ඉහත සඳහන් කළ විහාරස්ථාන දෙකෙහි වන පිරිත් මණ්ඩප නැතහොත් ධර්මාසන පිළිබඳව සංසන්දනාත්මක අධ්‍යයනය සඳහා පළමුව පිරිත් මණ්ඩප දෙකෙහි සමානතා හා අසමානතා අධ්‍යයනය කිරීම සිදු කරන ලදී. එහිදී කැටයම් කලාව පිළිබඳවත්, සිතුවම් කලාව පිළිබඳවත් අධ්‍යයනයට යොමු විය. යුරෝපීය ආභාසයත් සමඟ ඉදි වූ විහාරස්ථාන හෙයින් දේශීය කැටයම් කලාවෙහි සාම්ප්‍රදායික ලක්ෂණ මේ තුළින් නිරූපණය වන්නේ ද යන්න අධ්‍යයනය කිරීම සඳහා සාම්ප්‍රදායික සැරසිලි මෝස්තරවලින් යුත් කැටයම් අධ්‍යයනය කරන ලදී. එහිදී ඇම්බැක්ක දේවාලයේ ලී කැටයම්, පනාවිටිය අම්බලම වැනි ස්ථානවල ලී කැටයම් අධ්‍යයනය කරනු ලැබීය.

එමෙන් ම සිතුවම් පිළිබඳ ව අධ්‍යයනයේදී මහනුවර ශෛලියේ සිතුවම් හා පහතරට ශෛලියේ සිතුවම්වල ඇති වෙනස්කම් හඳුනාගැනීම සඳහා දෙගල්දොරුව විහාරස්ථානය, මැදවල විහාරස්ථානය වැනි මහනුවර සම්ප්‍රදායේ සිතුවම් සහිත කතළුව පූර්වාරාම විහාරස්ථානය, මිරිස්ස සමුද්‍රගිරි විහාරය වැනි විහාරස්ථානවල සිතුවම් අධ්‍යයනය කරන ලදී.

මෙහිදී කතළුව සුබෝධාරාමයේ පිරිත් මණ්ඩපයෙහි පහත කොටසේ වන සිතුවම් (මෙහි පෙරහැරක දර්ශනයක් වේ.) අධ්‍යයනයේදී එම විහාරස්ථානයේ බිත්තියෙහි පවතින සිතුවම් ශෛලිය සමඟ සමානතාවක් තිබේද යන්නත් එම සිතුවම් තුළින් නිරූපිත සමාජ පැතිකඩ අධ්‍යයනය සඳහා එකල සමාජ පසුබිම පිළිබඳව කරුණ අනාවරණය කරගන්නා ලදී. එහිදී එකල ශිල්පියාගේ නෙතට ග්‍රහණය වූ සමාජ පසුතලය කෙබඳු වී දැයි අධ්‍යයනය සඳහා යටත් විජිත යුගය පිළිබඳව ලියැවුණු ග්‍රන්ථ අධ්‍යයනය කිරීම සිදු කරන ලදී.

එමෙන් ම සම්මුඛ සාකච්ඡා මඟින් වර්තමානයේ මෙකී භාවිතයත්, යොදාගෙන ඇති ද්‍රව්‍ය පිළිබඳවත් අධ්‍යයනය සිදුවිය.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

ලංකාවේ සාම්ප්‍රදායික ලී කැටයම් කලාව හා සිතුවම් කලාව දේශීය මුහුණුවරින් මෙන් ම යුරෝපීය ලක්ෂණ සමඟ මුසු වූ කලාත්මක අංගයක් ලෙස කරගම්පිටිය සුබෝධාරාමයෙහි වන පිරිත්

මණ්ඩපයෙන් මනාව ඉස්මතු කර පෙන්වා දීමට හැකියාව ලැබේ. එහිදී යොදාගෙන තිබෙන කැටයම් සඳහා සාම්ප්‍රදායික මල් මෝස්තර හා සාම්ප්‍රදායික ලියවැල් රටාවෙන් ඔබ්බට ගිය නිර්මාණ ලක්ෂණ මතු වී පෙනේ. එහි සිතුවම් කර ඇති මිදි වැල් සහ රෝස මල් සහිත සිතුවම් තුළින් යුරෝපීය ආභාසය පිළිබිඹු වේ. එමෙන් ම මහනුවර සම්ප්‍රදායේ අඛණ්ඩ කථන සිතුවම්හි දක්නට ලැබෙන ද්විමාන රූප වෙනුවට ත්‍රිමාණ ලක්ෂණ වලින් යුත් මානව රූප ද යුරෝපීය ඇඳුම් මෝස්තර යුරෝපීය සංගීත භාණ්ඩ මෙහි දැකගත හැකි ය.

එහෙත් අහංගම බිම්බාරාමයේ විහාරස්ථානයේ දක්නට ලැබෙන පිරිත් මණ්ඩපයෙහි සිතුවම් ඇසුරෙන් දේශීය මල් මෝස්තර රටා, කැටයම් රටා දැකගත හැකි ය. මෙම විහාරස්ථාන දෙකෙහි පිරිත් මණ්ඩප හැඩය දෙයාකාරයකින් හඳුනාගත හැකිය. බිම්බාරාම විහාරස්ථානයේ පිරිත් මණ්ඩපය සම්පූර්ණ දැවයෙන් නිමවා ඇති අතර සුබෝධාරාමයෙහි පිරිත් මණ්ඩපයෙහි පාදම ගඩොල් මඟින් බඳින ලද ආසනයක සකසා ඇත. මෙවැනි වෙනස්කම් රාශියක් මෙහි හඳුනාගත හැකිය. දැවයෙන් ඉදිකරන ලද මෙම පිරිත් මණ්ඩප දෙකෙහි ම මධ්‍යයේ එක් ධර්මාසනයකි.

පහතරට චිත්‍ර ශෛලියෙහි, ඒ ඒ පුද්ගලයන් වෙන්කර හඳුනාගැනීම සඳහා යොදා ඇති ඇඳුම් පැළඳුම් උඩරට සිතුවම් රටාවට වඩා පැහැදිලි වෙනසක් පෙන්වයි. උදාහරණයක් ලෙස උඩරට සිතුවම්වල රාජකීය ඇඳුම් පැළඳුම් චිත්‍රයට නඟා ඇත්තේ උඩරට රජුන් ඒ වන විට පරිහරණය කළ ඇඳුම් අනුකරණය කිරීමෙන් වුවද පහතරට සිත්තරා එහිදී ගුරු කොට ගෙන ඇත්තේ පහතරට ප්‍රභූන්ගේ ඇඳුම් පැළඳුම්වල ස්වරූපය බව පෙන්වාදිය හැකි ය. (මහින්ද හිමි; 2007. 303) සමාජ පසුබිම පිළිබඳව තොරතුරු අධ්‍යයනයේ දී එළඹිය හැකි නිගමනය වූයේ එම ශිල්පීන් ඔවුන්ගේ නෙතට ගෝචර වන දර්ශන සිතුවම්කරණයේදී යොදාගත් බව ය. එය ඇඳුම් පැළඳුම්, භාවිතාකර ඇති උපකරණ, චාරිතා මඟින් පැහැදිලි විය.

මේ අනුව 19 වන සියවසේ ඉදි වූ පිරිත් මණ්ඩප දේශිය හා යුරෝපීය කලා සම්ප්‍රදායන් මිශ්‍ර ව වර්ධනය වූ නිර්මාණ ලෙස හඳුනා ගත හැකිය.

### ආශ්‍රිත ග්‍රන්ථ


ප්‍රියරත්න, අනිල් (2002) ***පිරිත හා බැඳි සිරිත***. පිළියන්දලඃ ඊ. සී. ඒ එන්ටර්ප්‍රයිසස්.

බෙන්තරගේ, ලයනල් (2000) ***සිංහල සැරසිලි කලාව***. කොළඹඃ එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස්.

මහින්ද හිමි, උණුවතුරබුබුලේ (2007) ***දකුණේ විහාරවල මහනුවර සම්ප්‍රදායේ චිත්‍ර***. වැල්ලම්පිටියඃ චතුර මුද්‍රණාලය.